සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

AL/2012/25-A-S-II

17697

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉතිහාසය II (I කොටස)
வரலாறு II (பகுதி I)
History II (Part I)

25-A S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**ඉන්දීය ඉතිහාසය - ඈත අතීතයේ සිට 1206 දක්වා**

විභාග අංකය: ..................................

**උපදෙස් :**

* මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා, දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
* **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
* කොටස් දෙකට ම මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු, **I** කොටස **II** කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

* අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක්ද'යි හඳුනාගෙන එහි **අංකය වරහන් තුළ ලියන්න.**

1. (1) චතුර්වේද (2) බ්‍රාහ්මණ (3) ආරණ්‍යක
   (4) උපනිෂද් (5) පුරාණ (.........)

2. (1) රූපාර් (2) හරප්පා (3) ඉන්ද්‍රප්‍රස්ථ
   (4) චන්හුදරෝ (5) මොහෙන්ජොදරෝ (.........)

3. (1) විදේහ (2) අවන්ති (3) මල්ල
   (4) කෝලිය (5) ලිච්ඡවි (.........)

4. (1) ඩිමෙට්‍රියස් (2) මිනැන්ඩර් (3) පළමුවන ස්ට්‍රේටෝ
   (4) කුජුල කැඩ්පයිසීස් (5) හර්මයියොස් (.........)

5. (1) කාර්ලේ (2) අජන්තා (3) එල්ලෝරා
   (4) මථුරා (5) උදයගිරි (.........)

6. (1) ශාකුන්තල (2) නාගානන්ද (3) මේඝදූත
   (4) මාලවිකාග්නිමිත්‍ර (5) මෘච්ඡකටිකා (.........)

7. (1) සිමුක (2) පළමුවන සාතකර්ණි (3) ගෞතමීපුත්‍ර සාතකර්ණි
   (4) වින්ධ්‍යාශක්ති (5) යඥ ශ්‍රී සාතකර්ණි (.........)

8. (1) උග්‍රසේන (2) මහේන්ද්‍ර (3) ව්‍යාඝ්‍රරාජ
   (4) සිංහවිෂ්ණු (5) විෂ්ණුගෝප (.........)

9. (1) ධර්මපාල (2) ශශාංක (3) හර්ෂවර්ධන
   (4) දෙවන පුලකේශින් (5) දෙවන ධ්‍රැවසේන (.........)

10. (1) වසුමිත්‍ර (2) අශ්වඝෝෂ (3) වසුබන්ධු
    (4) නාගර්ජුන (5) වාල්මීකී (.........)

* අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ. එම නො ගැළපෙන** යුගලය කුමක්ද'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **වරහන් තුළ ලියන්න.**

11. (1) මහබලිපුරම්හි රථ දේවාලය - පල්ලව
    (2) ඛජුරාහෝහි කන්දරිය මහාදේව දේවාලය - වාකාටක
    (3) එල්ලෝරාහි කයිලාසනාථ දේවාලය - රාෂ්ට්‍රකූට
    (4) තංජෝරයේ බෘහදේශ්වර දේවාලය - චෝළ
    (5) බේලූර්හි චෙන්නකේශව දේවාලය - හොයිසාල (.........)

[ දෙවැනි පිටුව බලන්න.

12. (1) පානිණී - අෂ්ටාධ්‍යායී
(2) විශාඛදත්ත - මුද්‍රාරාක්ෂ
(3) භාරවි - කිරාතාර්ජුනීය
(4) දන්ඩින් - දශකුමාරචරිත
(5) ආර්යභට්ට - බෘහද්සංහිතා (.........)

13. (1) දේවගිරි - යාදව
(2) ද්වාරසමුද්‍ර - හොයිසාල
(3) ගුජරාට - පරමාර
(4) කල්‍යාණී - බටහිර චාලුක්‍යයෝ
(5) වරංගල් - කාකතිය (.........)

14. (1) බින්දුසාර - අමිත්‍රඝාත
(2) සමුද්‍රගුප්ත - කවිරාජ්
(3) දෙවන චන්ද්‍රගුප්ත - වික්‍රමාදිත්‍යය
(4) හර්ෂවර්ධන - මෞඛරී
(5) දෙවන පුලකේශින් - පරමේශ්වර (.........)

15. (1) සුප්පාරක - තප්ති
(2) බාරාණසි - ගංගා
(3) භාරුකච්ඡ - නර්මදා
(4) ඉන්ද්‍රප්‍රස්ථ - යමුනා
(5) ප්‍රතිෂ්ඨාන - ගෝධාවරි (.........)

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නො වේ. Y තීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග **පහෙන්** එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන් තුළ ලියන්න.**

16.

| X | Y |
|---|---|
| (i) ගෞතමීපුත්‍ර සාතකර්ණී | A හතිගුම්පා |
| (ii) දෙවන පුලකේශින් | B මස්කි |
| (iii) අසෝක | C අයිහෝලේ |
| (iv) ඛාරවේල | D භිටරි |
| (v) ස්කන්ධ ගුප්ත | E නාසික් |

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (.........)

17.

| X | Y |
|---|---|
| (i) ඩිමොකොස් | A පුෂ්‍යමිත්‍ර ශුංග |
| (ii) දන්ඩින් | B බින්දුසාර |
| (iii) ෆාහියන් | C හර්ෂවර්ධන |
| (iv) හියුං සාං | D දෙවන චන්ද්‍රගුප්ත |
| (v) පතංජලි | E දෙවන නරසිංහවර්මන් |

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (.........)

18.

| X | Y |
|---|---|
| (i) සිංහවිෂ්ණු | A දෙවන නාගභට |
| (ii) වත්සරාජ | B සමුද්‍රගුප්ත |
| (iii) බින්දුසාර | C මහේන්ද්‍රවර්මන් |
| (iv) ස්කන්ධගුප්ත | D පුරුගුප්ත |
| (v) පළමුවන චන්ද්‍රගුප්ත | E අසෝක |

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (.........)

19.

| X | Y |
|---|---|
| (i) සාර්ථවාහ | A දෙවන චන්ද්‍රගුප්ත රජුගේ දියණිය |
| (ii) දේවි චන්ද්‍රගුප්තම් | B නාට්‍යයක් |
| (iii) ප්‍රභාවතී දේවි | C බදු |
| (iv) මහා දණ්ඩනායක | D වෙළඳ නායක |
| (v) ශුල්ක | E ප්‍රධාන සේනාපති |

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (.........)

[ තුන්වෙනි පිටුව බලන්න.

**20.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ව්‍යාකරණ | A | සූර්ය සිද්ධාන්ත |
| (ii) | තාරකාශාස්ත්‍ර | B | රාජතරංගිණී |
| (iii) | දර්ශනය | C | මහාභාෂ්‍ය |
| (iv) | මහා කාව්‍ය | D | රඝුවංශ |
| (v) | ඉතිහාසය | E | සාංඛ්‍යසූත්‍ර |

(1) ADCBE (2) BEDCA (3) CAEDB (4) DBAEC (5) ECBAD (………)

● අංක **21** සිට **25** තෙක් සෑම ප්‍රශ්නයකට ම නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන් තුළ** ලියන්න.

**21. මහා නාන තටාකයේ නටබුන් දක්නට ලැබෙන්නේ කුමන ඉන්දු නිම්න නගරයේ ද?**
(1) කලිබංගන්
(2) රූපාර්
(3) හරප්පා
(4) මොහෙන්ජොදාරෝ
(5) චන්හුදාරෝ (………)

**22. පිය රජතුමා මිය යන විට අශෝක යුවරජකු ලෙස කටයුතු කළේ කුමන නගරයේ ද?**
(1) තක්ෂිලා
(2) උජ්ජේනි
(3) තෝසලී
(4) ධෞලී
(5) සුවර්ණගිරි (………)

**23. බෞද්ධ ප්‍රාඥයකු වූ වසුමිත්‍ර කාගේ සමකාලීනයකු ද?**
(1) අශෝක
(2) මිනැන්ඩර්
(3) කණිෂ්ක
(4) හර්ෂවර්ධන
(5) ධර්මපාල (………)

**24. දකුණු ඉන්දියාවට ආර්ය සභ්‍යත්වය ගෙන ගිය මුනිවරයා කවරෙක් ද?**
(1) වාල්මිකී
(2) විශ්වමිත්‍ර
(3) වසුබන්දු
(4) භරත
(5) අගස්ත්‍ය (………)

**25. මුම්මුඩි චෝළ යන විරුදය භාවිත කළ රජතුමා කවරෙක් ද?**
(1) පළමුවන ආදිත්‍ය
(2) පළමුවන පරන්තක
(3) පළමුවන රාජරාජ
(4) පළමුවන රාජේන්ද්‍ර
(5) පළමුවන කුලෝත්තුංග (………)

● අංක **26** සිට **30** තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක් අදාළ මාතෘකාවට නො ගැළපේ**. එය තෝරා ඊට අදළ **අංකය** ඉදිරියේ ඇති **වරහන් තුළ** ලියන්න.

**26. පැරණි ඉන්දියානු ඉතිහාසය ගොඩනැගීමේ දී සෙල්ලිපිවල ඇති වැදගත්කම**
(1) රාජධානිවල බලය ව්‍යාප්තව පැවැති ප්‍රදේශ හඳුනා ගැනීමට උපකාරී වේ.
(2) ප්‍රස්තුත කාලපරිච්ඡේදවල ලේඛන ක්‍රමවේද පිළිබඳ අදහසක් ඒ මගින් අපට සැපයේ.
(3) වැදගත් සමහර ස්ථාන හඳුනා ගැනීමට උපකාරී වේ.
(4) කාල නිර්ණය සැකසීමට උපකාරී වේ.
(5) සෙල්ලිපි නිතරම නිවැරදි හා සත්‍ය තොරතුරු ඉදිරිපත් කරයි. (………)

**27. හරප්පා නගරය**
(1) නගරය ඉදිකරන ලද්දේ සැළසුමකට අනුව ය.
(2) විශාල ගොඩනැගිලි ගොඩනංවා ඇත්තේ වටකුරු කුලුනු සහිතව ය.
(3) හරප්පා නගරය බලකොටු ප්‍රදේශය සහ නගර ප්‍රදේශය නමින් ප්‍රධාන කොටස් දෙකකින් සමන්විත විය.
(4) වීථි පළල් වූ අතර මීටර් 4 සිට 10 දක්වා පළලක් එහි දක්නට තිබිණි.
(5) නගරයෙහි කාර්යක්ෂම ජලය බැසයන ක්‍රමයක් පැවතිණි. (………)

[ හතරවෙනි පිටුව බලන්න.

17697

**28. මෞර්යයන්ගෙන් අනතුරුව දකුණු ඉන්දියාව**

(1) දකුණු ඉන්දියාවේ චෝළ, චේර සහ පාණ්ඩ්‍යයෝ මෞර්යයන්ගෙන් පසුව ද නිදහස් පාලකයෝ වූහ.
(2) කරිකාල ක්‍රි.ව. දෙවන සියවසේ සිටි වැදගත් චෝළ පාලකයෙකි.
(3) චේරයෝ ගුප්ත අධිරාජ්‍ය සමඟ සමීප වෙළඳ සම්බන්ධතා පැවැත්වූහ.
(4) පාණ්ඩ්‍යය රාජ්‍ය පාලනය කරන ලද්දේ කාන්තාවක විසින් බව සමකාලීන බටහිර ලේඛකයෙක් පවසා ඇත.
(5) පාණ්ඩ්‍ය රජවරුන්ගේ අනුග්‍රහය යටතේ සංගම් නමින් හැඳින්වූ කවීන්ගේ සමුළු තුනක් පවත්වා ඇත.(.........)

**29. ගුප්තයන් යටතේ ආගම**

(1) ගුප්ත රජවරු දැඩි හින්දු භක්තිකයෝ වූහ.
(2) ගුප්ත යුගයේ දී පැරණි බ්‍රාහ්මණ ආගම හින්දු ආගම බවට පරිවර්තනය විය.
(3) මෙම යුගයේ දී බ්‍රහ්ම, විෂ්ණු හා ශිව වැනි දෙවිවරු ප්‍රමුඛත්වයට පැමිණියහ.
(4) ගුප්ත පාලකයන් විසින් ජෛනාගම හා බුද්ධාගම මර්දනය කරන ලදී.
(5) හින්දු දේව වන්දනය ජනප්‍රිය අංගයක් බවට පත් විය. (.........)

**30. හූණ ආක්‍රමණවල බලපෑම**

(1) ඔවුහු උතුරු ඉන්දියාවේ එක්සත් භාවය විනාශ කළහ.
(2) ඉන්දියානුන්ගේ ධනය කොල්ල කෑහ.
(3) ඔවුහු පසුව උතුරු ඉන්දියාවේ ප්‍රධානතම පාලකයෝ බවට පත් වූහ.
(4) කාශ්මීරයේ බෞද්ධ ආරාම සහ සිද්ධස්ථාන විනාශ කර දැමූහ.
(5) හූණයන් හින්දු සමාජයට සම්මිශ්‍රණය වීම හේතු කොට ගෙන නව කුල බිහිවිය. (.........)

● අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය.** නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

(A) සහ (B) පමණක් නිවැරදි නම් ....................................... **1 ද,**
(B) සහ (C) පමණක් නිවැරදි නම් ....................................... **2 ද,**
(C) සහ (D) පමණක් නිවැරදි නම් ....................................... **3 ද,**
(A) සහ (C) පමණක් නිවැරදි නම් ....................................... **4 ද,**
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් .......... **5 ද, වරහන් තුළ ලියන්න.**

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

**31. ඍග්වේදය**

(A) ඍග්වේදයෙහි වින්ධ්‍යා කඳුවැටිය සහ සත්පුර කඳු පිළිබඳ සඳහන් නො වේ.
(B) එසේ වුව ද ඍග්වේද වැසියෝ හිමාලය පැවැති බව ගැන දැන සිටියහ.
(C) පශුපති දෙවියන් සතුටු කිරීම සඳහා සතුන් බිලිදීම ඍග් වෛදික වැසියන් විසින් කරන ලදී.
(D) මරණයෙන් මතු ජීවිතයක් පිළිබඳ ඍග්වේද වැසියෝ විශ්වාස නො කළහ. (.........)

**32. ජෛනාගම**

(A) ජෛනාගම ආරම්භ කරන ලද්දේ අජිත කේශකම්බල විසිනි.
(B) ජෛන ආගමිකයෝ දෙවියන් විශ්වාස කළහ.
(C) දිගම්බර හා ස්වේතාම්බර නම් නිකාය දෙකකට ජෛන ආගමිකයෝ අයත් වූහ.
(D) ජෛන ආගමිකයෝ වර්ණ ක්‍රමය හෝ යාග හෝ විශ්වාස නො කළහ. (.........)

**33. මෞර්යයෝ**

(A) අශෝක සෙල්ලිපිවලින් බහුතරයක් ලියවී ඇත්තේ ඛරෝෂ්ඨී සහ බ්‍රාහ්මී අක්ෂරවලිනි.
(B) චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ පාලනය පිළිබඳ අගනා තොරතුරු ග්‍රීක ඉතිහාසඥයෙක් වූ හෙරඩෝටස් සපයයි.
(C) අශෝක සෙල්ලිපිවල සඳහන් ප්‍රියදර්ශන රජු අශෝක ලෙස හඳුනාගත්තේ දීපවංසය හා මහාවංසය ඇසුරෙනි.
(D) මෞර්යයන් කාසි භාවිත කළ බවට සාධක හමු වී නොමැත. (.........)

**34. රුද්‍රදාමන්ගේ ජුනාගාර් සෙල්ලිපිය**

(A) මෙම සෙල්ලිපිය නිකුත් කරවූ රුද්‍රදමන් වනාහි මෞර්ය යටත් පාලකයෙකි.
(B) සෙල්ලිපියට අනුව අශෝක යටතේ සෞරාෂ්ට්‍රයේ ප්‍රාදේශීය ආණ්ඩුකාරයා වූයේ යවනරාජ තුසාප නමැත්තෙකි.
(C) ගිර්නාර්හි සුදර්ශන ජලාශය ඉදිකරවන ලද්දේ චන්ද්‍රගුප්ත මෞර්ය රජු යටතේ එම තනතුර ම හෙබ වූ වෛශ්‍ය පුෂ්‍යගුප්ත විසින් බව මෙම සෙල්ලිපියේ සඳහන් වේ.
(D) සෞරාෂ්ට්‍රය පිහිටියේ ඩෙකානයේ ය. (.........)

35. **හර්ෂවර්ධන රජුගෙන් පසු උතුරු ඉන්දියාව**
    (A) හර්ෂවර්ධනගේ අභාවයෙන් පසු උතුරු ඉන්දියාවේ කුඩා රාජ්‍ය කිහිපයක් බිහි විය.
    (B) ඒ අතුරෙන් ප්‍රතිහාර, පාල හා රාෂ්ට්‍රකූට යන රාජ්‍යයෝ පෙරමුණට පැමිණිය හ.
    (C) මෙම රාජ්‍ය තුන විසින් උතුරු ඉන්දියාවේ ආධිපත්‍ය සඳහා එකිනෙකා අතර අරගල ඇති කරගන්නා ලදී.
    (D) එසේ වුව ද එම රාජ්‍යයන්ගෙන් කිසිම රාජ්‍යයක් ජයග්‍රාහී නොවී ය. (.........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලයදැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන් තුළ ලියන්න.**

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| 1. | නිවැරදි ය. | වැරදි ය. |
| 2. | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3. | වැරදි ය. | වැරදි ය. |
| 4. | වැරදි ය. | නිවැරදි ය. |
| 5. | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | මහාභාරතය ආර්යයන් හා අනාර්යයන් අතර ගැටුම් විස්තර කරයි. | භගවත් ගීතා වනාහි බුද්ධ චරිතය කාව්‍යයෙන් ලියා ඇති ග්‍රන්ථයකි. | (.........) |
| 37. | අශෝක රජු යටතේ මහාමාත්‍රවරුන්ට පැවරී තිබුණු රාජකාරිය වූයේ වැසියන් අතර බුද්ධාගම ප්‍රචාරය කිරීම ය. | ධර්ම මහා මාත්‍රවරුන්ගේ වගකීම වූයේ (අශෝක) ධර්මය ප්‍රචාරය කිරීම ය. | (.........) |
| 38. | හර්ෂවර්ධනගේ රාජ්‍යයේ දකුණු දේශ සීමාව වූයේ නර්මදා නදියයි. | හර්ෂවර්ධන රජු විසින් බෞද්ධ සම්මේලන දෙකක් ප්‍රයාගයේ සහ කනෞජයේ පවත්වන ලදී. | (.........) |
| 39. | ක්‍රි.ව. අටවන සියවස මුල දී මොහොමඩ් බින් කාසිම් යටතේ පැමිණි අරාබිහු සින්ඩ් සහ මුල්තාන් අල්ලා ගත්හ. | අරාබි පාලනය හේතු කොට ගෙන අරාබි රටවල් සමඟ වෙළඳාම ශක්තිමත් වීම, අරාබින්ට ඉන්දියානු ප්‍රදේශවල පදිංචි වීමට ධෛර්ය දීම සහ වෛද්‍ය හා ජ්‍යෝතිෂය පිළිබඳ ඉන්දීය ග්‍රන්ථ අරාබි භාෂාවලට පරිවර්තනය කිරීම සිදු විය. | (.........) |
| 40. | චෝළ රජවරු ශිවාගමට අනුග්‍රහ දක්වන්නෝ වූහ. | ශ්‍රී විජය පාලකයන් විසින් නාගපට්ටිනම්හි බෞද්ධ ආරාමයකට කළ ප්‍රදානයන් චෝළයන් විසින් නවත්වා දමන ලදී. | (.........) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉතිහාසය II (II කොටස)
வரலாறு II (பகுதி II)
History II (Part II)

25-A S II

**ඉන්දියා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1206 දක්වා**

**උපදෙස්:**

※ **පළමුවන** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ඉන්දියාවේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

**1.** ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට, නම් කර** ඒවායින් ඕනෑ ම **දෙකක්** පිළිබඳ ව ඓතිහාසික සටහන් ලියන්න.

(i) කයිබර් කපොල්ල  (ii) භාරුකච්ඡ
(iii) පුරුෂපුර  (iv) කාවේරි ගඟ
(v) වින්ධ්‍යා කඳුවැටිය  (vi) තංජෝර්
(vii) පාටලීපුත්‍ර  (viii) ලෝතාල්

*(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි)*

**2.** වයඹදිග කපොලු පැරණි ඉන්දියානු ඉතිහාසය කෙරෙහි බලපෑ අයුරු පැහැදිලි කරන්න. *(ලකුණු 14 යි)*

**3.** හරප්පා සභ්‍යත්වයේ පැවැති සමාජ හා ආර්ථික තත්ත්වය සාකච්ඡා කරන්න. *(ලකුණු 14 යි)*

**4.** පශ්චාද් වෛදික යුගයේ වැසියාගේ ආගමික හා දේශපාලන ජීවිතයෙහි දක්නට ඇති ප්‍රධාන ලක්ෂණ කවරේ ද? *(ලකුණු 14 යි)*

**5.** "මෞර්ය අධිරාජ්‍යයේ ශ්‍රේෂ්ඨතම පාලකයා අසෝක රජතුමා විය."

(i) මෞර්ය වංශයේ ආරම්භකයා කවරෙක් ද? *(ලකුණු 01 යි)*

(ii) අසෝක රජු පිළිබඳ අධ්‍යයනයේ දී භාවිත කළ හැකි ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය **දෙකක්** නම් කරන්න. *(ලකුණු 02 යි)*

(iii) මෞර්ය අධිරාජ්‍යයේ නැගීමට තුඩුදුන් සාධක කෙටියෙන් දක්වන්න. *(ලකුණු 03 යි)*

(iv) අසෝක රජුගේ දේශපාලන හා සංස්කෘතික කාර්ය සිද්ධීන් කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය සාකච්ඡා කරන්න. *(ලකුණු 08 යි)*

**6.** **එක්කෝ A** කොටසට **නැතහොත් B** කොටසට පමණක් පිළිතුරු සපයන්න.

(A) ඉන්දු - ග්‍රීක හා ශක ආක්‍රමණ කෙටියෙන් හඳුන්වා දී ඒවායේ ප්‍රතිඵල පරීක්ෂා කරන්න. *(ලකුණු 14 යි)*

(B) ඩෙකානයේ සාතවාහන පාලකයන්ගේ කාර්ය සංසිද්ධීන් විමසන්න. *(ලකුණු 14 යි)*

**7.** "හූණ ආක්‍රමණ ගුප්ත අධිරාජ්‍යයේ බිඳවැටීමට ප්‍රධාන සාධකය විය." මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. *(ලකුණු 14 යි)*

**8.** චෝළ පරිපාලනයේ දක්නට ලැබෙන මුඛ්‍ය ලක්ෂණ පරීක්ෂා කරන්න. *(ලකුණු 14 යි)*

**9.** ක්‍රි.ව. 1206 දක්වා ඉන්දියාවට එල්ල වූ තුර්කි-ඇෆ්ගන් ආක්‍රමණ පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. *(ලකුණු 14 යි)*

* * *

17697

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉතිහාසය II
வரலாறு II
History II

25-A S

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. } 01

විභාග අංකය / சுட்டெண் / Index No. } ....................................



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉතිහාසය II (I කොටස)
வரலாறு II (பகுதி I)
History II (Part I)

25-B S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

යුරෝපා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1989 දක්වා

විභාග අංකය: ..................................

උපදෙස් :

- මෙම කොටස ප්‍රශ්න **40** කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි.
- එම නිවැරදි පිළිතුර තෝරා දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
- කොටස් දෙකට ම මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු, I කොටස, II කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක **1** සිට **10** තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක්දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන් තුළ ලියන්න.**

1. (1) යුප්‍රටීස් (2) ක්‍රීට් (3) සයිප්‍රස් (4) සිසිලි (5) කෝර්සිකා (.........)

2. (1) ඇතන්ස් (2) මෙගාර (3) මිලේටස් (4) සමෝස් (5) පර්සියාව (.........)

3. (1) රාජාණ්ඩුව (2) කතිපයාධිපති ආණ්ඩුව (3) ප්‍රජා පීඩක පාලනය (4) පූජක තන්ත්‍රය (5) ප්‍රජාතන්ත්‍රවාදය (.........)

4. (1) යුදෙව්වරු (2) ඔස්ට්‍රොගොත්වරු (3) විසිගොත්වරු (4) ලොම්බාර්ඩ්වරු (5) වැන්ඩල්වරු (.........)

5. (1) බොලොඤ්ඤ (2) පැරිස් (3) අබෙලාර්ඩ් (4) ඔක්ස්ෆර්ඩ් (5) හයිඩල්බර්ග් (.........)

6. (1) ලැන්කැස්ටර් (2) ෆ්‍රෑන්ක් (3) යෝර්ක් (4) ටියුඩර් (5) හැනෝවර් (.........)

7. (1) ජෝන් කැබෝ (2) කාටියර් (3) ජොලියට් (4) ලා සලේ (5) මර්ක්වෙට් (.........)

8. (1) බොස්පරස් (2) ඩාර්ඩනල්ස් (3) ජිබ්‍රෝල්ටා (4) මලක්කා (5) පැනමා (.........)

9. (1) රොබට් වෝල්පෝල් (2) රොබට් ඕවන් (3) හෙන්රි පාමස්ටන් (4) බෙන්ජමින් ඩිස්රායලි (5) විලියම් ග්ලැඩ්ස්ටන් (.........)

10. (1) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)
(2) ජාත්‍යන්තර අධිකරණය (ICJ)
(3) එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)
(4) උතුරු අත්ලන්තික් ගිවිසුම් සංවිධානය (NATO)
(5) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ. එම නො ගැළපෙන** යුගලය කුමක්ද'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය**, ඉදිරියේ ඇති **වරහන් තුළ ලියන්න.**

**11.** (1) සියුස් - ජුපිටර්
(2) ඇතීනා - මිනෙර්වා
(3) ඇපොලෝ - සාතන්
(4) ඇෆ්‍රොඩයිටි - වීනස්
(5) පොසීඩන් - නෙප්චූන් (.........)

**12.** (1) සොක්‍රටීස් - සද්භාවය වූ කලී දැනුමයි.
(2) හිපොක්‍රටීස් - සෑම රෝගයකට ම ස්වභාවික හේතුවක් ඇත.
(3) ප්ලේටෝ - දාර්ශනික රජ
(4) ඇරිස්ටෝටල් - මිනිසා, දේශපාලන සත්ත්වයෙකි.
(5) මකියාවෙලි - මිනිසා නිදහස් ව උපත ලබා ඇත. (.........)

**13.** (1) රෝම අධිරාජ්‍යය - රෝමය
(2) ඔටොමන් අධිරාජ්‍යය - කොන්ස්තන්තිනෝපලය
(3) ඔස්ට්‍රියානු අධිරාජ්‍යය - වියනා
(4) බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය - ග්ලාස්ගෝ
(5) ජර්මන් අධිරාජ්‍යය - බර්ලින් (.........)

**14.** (1) සියක් අවුරුදු යුද්ධය - ප්‍රංශය පාර්ශවකරුවෙකි.
(2) තිස් අවුරුදු යුද්ධය - ප්‍රංශය පාර්ශවකරුවෙකි.
(3) හත් අවුරුදු යුද්ධය - ප්‍රංශය පාර්ශවකරුවෙකි.
(4) ක්‍රිමියානු යුද්ධය - ප්‍රංශය පාර්ශවකරුවෙකි.
(5) සත් සති යුද්ධය - ප්‍රංශය පාර්ශවකරුවෙකි. (.........)

**15.** (1) හසයිට්වරු - බොහිමියාව
(2) ලූතර්වාදීන් - ග්‍රීසිය
(3) හියුගනෝවරු - ප්‍රංශය
(4) පියුරිටන්වරු - එංගලන්තය
(5) ප්‍රෙස්බිටේරියන්වරු - ස්කොට්ලන්තය (.........)

- අංක **16** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නො වේ. Y තීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග **පහෙන්** එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන් තුළ ලියන්න.**

**16.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ක්ලිස්තිනිස් | A | වෛද්‍ය විද්‍යාවේ පියා |
| (ii) | හෙරඩෝටස් | B | ඇතිනියානු ප්‍රජාතන්ත්‍රවාදයේ පියා |
| (iii) | හිපොක්‍රටීස් | C | පළමුවන රෝම අධිරාජයා |
| (iv) | ඔක්ටේවියන් | D | මානවවාදයේ පියා |
| (v) | පෙට්රාක් | E | ඉතිහාසයේ පියා |

(1) DECAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

**17.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ප්ලේටෝ | A | ඩිකැමරන් |
| (ii) | ටැසිටස් | B | යුටෝපියා |
| (iii) | බොකැෂියෝ | C | මූඪත්වයේ අගය වැනීම |
| (iv) | ඉරාස්මස් | D | ජනරජය |
| (v) | තොමස් මෝර් | E | ඉතිහාස |

(1) DECAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

**18.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | ටොලමි | A | පරිනාමවාදී න්‍යාය |
| (ii) | කොපර්නිකස් | B | සාපේක්ෂතාවාදී න්‍යාය |
| (iii) | අයිසැක් නිව්ටන් | C | ගුරුත්වාකර්ෂණය පිළිබඳ නියාමය |
| (iv) | චාර්ල්ස් ඩාර්වින් | D | පෘථිවිය කේන්ද්‍රකරගත් විශ්වය පිළිබඳ න්‍යාය |
| (v) | ඇල්බට් අයින්ස්ටයින් | E | සූර්යයා කේන්ද්‍ර කරගත් විශ්වය පිළිබඳ න්‍යාය |

(1) DECAB (2) CEABD (3) DEACB (4) BEACD (5) EDACB (.........)

[ තුන්වෙනි පිටුව බලන්න.

**19.**

| X | Y |
|---|---|
| (i) 313 | A නැන්ට්ස් ආඥාව |
| (ii) 1215 | B ක්‍රිස්තියානියට ආගමික නිදහස ලබා දුන් මිලාන් ආඥාව |
| (iii) 1598 | C විප්ලව වර්ෂය |
| (iv) 1848 | D බර්ලින් තාප්පය බිඳ දැමීම |
| (v) 1989 | E මහාධිකාරී පත්‍රය |

(1) DECAB　(2) CEABD　(3) DEACB　(4) BEACD　(5) EDACB　(.........)

**20.**

| X | Y |
|---|---|
| (i) වැලෝයි | A එංගලන්තය |
| (ii) බූගන්සා | B ඉතාලිය |
| (iii) රොමනොෆ් | C රුසියාව |
| (iv) ස්ටුවට් | D ප්‍රංශය |
| (v) සැවෝයි | E පෘතුගාලය |

(1) DECAB　(2) CEABD　(3) DEACB　(4) BEACD　(5) EDACB　(.........)

**21.**

| X | Y |
|---|---|
| (i) ස්පාඤ්ඤය | A දහතුන්වන ලුවී |
| (ii) එංගලන්තය | B දෙවන වික්ටර් එමැනුවෙල් |
| (iii) ප්‍රංශය | C නිශ්ශබ්ද විලියම් |
| (iv) නෙදර්ලන්තය | D ෆර්ඩිනන්ඩ් සහ ඉසබෙලා |
| (v) ඉතාලිය | E හත්වන හෙන්රි |

(1) DECAB　(2) CEABD　(3) DEACB　(4) BEACD　(5) EDACB　(.........)

**22.**

| X | Y |
|---|---|
| (i) නව ලෝකය | A බ්‍රිතාන්‍යය |
| (ii) භූගෝලීය ප්‍රකාශයක් පමණි. | B ඉන්දියාව |
| (iii) හිරු නොබසින අධිරාජ්‍යය | C අමෙරිකා මහාද්වීපය |
| (iv) [බ්‍රිතාන්‍ය] කිරීටයේ මාණික්‍යය | D තුර්කිය |
| (v) යුරෝපයේ රෝගියා | E ඉතාලිය |

(1) DECAB　(2) CEABD　(3) DEACB　(4) BEACD　(5) EDACB　(.........)

**23.**

| X | Y |
|---|---|
| (i) තොමස් හොබ්ස් | A උපයෝගිතාවාදය |
| (ii) මොන්ටෙස්කියු | B තනි රටේ සමාජවාදය |
| (iii) ජෙරමි බෙන්තම් | C නොනවතින විප්ලවය |
| (iv) ලියොන් ට්‍රොට්ස්කි | D බලතල බෙදීම |
| (v) ජෝශප් ස්ටාලින් | E පරමාධිකාරී ආණ්ඩුව |

(1) DECAB　(2) CEABD　(3) DEACB　(4) BEACD　(5) EDACB　(.........)

**24.**

| X | Y |
|---|---|
| (i) උත්කෘෂ්ට විප්ලවය | A මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශනය |
| (ii) අමෙරිකන් විප්ලවය | B අයිතිවාසිකම් පනත |
| (iii) ප්‍රංශ විප්ලවය | C නිර්ධන පන්තියේ ආඥාදායකත්වය |
| (iv) රුසියානු විප්ලවය | D මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය |
| (v) එක්සත් ජාතීන්ගේ සංවිධානය | E ස්වාධීනතා ප්‍රකාශනය |

(1) DECAB　(2) CEABD　(3) DEACB　(4) BEACD　(5) EDACB　(.........)

**25.**

| X | Y |
|---|---|
| (i) වර්සායි ගිවිසුම | A බල්ගේරියාව |
| (ii) ශා. ජර්මේන් ගිවිසුම | B තුර්කිය |
| (iii) නියුලි ගිවිසුම | C හංගේරියාව |
| (iv) ට්‍රියනොන් ගිවිසුම | D ජර්මනිය |
| (v) ලොසෑන් ගිවිසුම | E ඔස්ට්‍රියාව |

(1) DECAB　(2) CEABD　(3) DEACB　(4) BEACD　(5) EDACB　(.........)

2911

- අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති (A), (B), (C) සහ (D) යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය.** නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,

(A) සහ (B) පමණක් නිවැරදි නම් ................................. 1 ද,
(B) සහ (C) පමණක් නිවැරදි නම් ................................. 2 ද,
(C) සහ (D) පමණක් නිවැරදි නම් ................................. 3 ද,
(A) සහ (C) පමණක් නිවැරදි නම් ................................. 4 ද,
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් ......... 5 ද, **වරහන් තුළ ලියන්න.**

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A) සහ (B) පමණක් නිවැරදි ය. | (B) සහ (C) පමණක් නිවැරදි ය. | (C) සහ (D) පමණක් නිවැරදි ය. | (A) සහ (C) පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

**26. පහත සඳහන් අය අතුරෙන් ග්‍රීක ගී කාව්‍ය රචකයෝ කවරහු ද?**
(A) සැෆෝ
(B) පයිතගරස්
(C) පින්ඩාර්
(D) පෙරික්ලීස් (.........)

**27. රෝම සංස්කෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේද?**
(A) පාර්තිනොන් යනු වඩාත් ම ප්‍රසිද්ධ රෝම දේවස්ථානයයි.
(B) ෆීඩියාස් යනු ප්‍රසිද්ධ රෝම මූර්ති ශිල්පියෙකි.
(C) රෝම අධිරාජයන් විසින් විනෝදජනක කටයුතු සඳහා වූ ස්ථානයක් ලෙස කොලෝසියම තනන ලදී.
(D) රෝම ගෘහ නිර්මාණ ශිල්පය මූලික වශයෙන් උපයෝගිතා අරමුණු කෙරෙහි යොමු වී ඇත. (.........)

**28. පුනරුදය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේද?**
(A) පුනරුදය, උතුරු ඉතාලියේ ස්වාධීන රාජ්‍යවල ආරම්භ විය.
(B) පුනරුද සමයේ දී ග්‍රීක සහ ලතින් සංස්කෘතික ආකෘතීන් පුනර්ජීවනයට පත් විය.
(C) තුර්කීන් විසින් කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීම, පුනරුදය ඇතිවීමට තුඩු දුන් වැදගත් සාධකයකි.
(D) පුනරුදයේ ප්‍රධාන අනුග්‍රාහකයෙක් නම් නාවික හෙන්රි ය. (.........)

**29. පහත සඳහන් කරුණු අතුරෙන් ජාතික රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ කවරේ ද?**
(A) ශක්තිමත් ස්ථාවර හමුදාව
(B) ශක්තිමත් මධ්‍යම ආණ්ඩුව
(C) පසමිතුරු වැඩවසම් රදළ පන්තිය
(D) දේශපාලන බලය විකේන්ද්‍රගත ව පැවතීම (.........)

**30. පහත සඳහන් අය අතුරෙන් ප්‍රංශයේ සිටි ප්‍රධාන ඇමතිවරු කවරහු ද?**
(A) හෙන්රි හඩ්සන්
(B) රිචලියු
(C) මැසරින්
(D) වෝල්ටෙයාර් (.........)

- අංක 31 සිට 35 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු **පහ** බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් **එකක්** අදළ මාතෘකාවට **නො ගැළපේ.** එම **නො ගැළපෙන** කරුණ තෝරා එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන් තුළ** ලියන්න.

**31. මුල්කාලීන ක්‍රිස්තියානි ආගම.**
(1) ක්‍රිස්තියානි ධර්මය, ජේසුස් වහන්සේගේ උපත, මරණය හා ඉගැන්වීම් මත පදනම් ව පවතී.
(2) රෝම බලධාරීන් විසින් ජේසුස් වහන්සේ කුරුසියේ ඇණ ගසා මරණයට පත් කරන ලදී.
(3) ක්‍රිස්තියානි ධර්මය ඒකදේවවාදයකි.
(4) නීරෝ අධිරාජයා ක්‍රිස්තියානි ආගමට අගමික නිදහස ප්‍රදානය කළේ ය.
(5) තියඩෝසියස් අධිරාජයා ක්‍රිස්තියානි ධර්මය රෝම අධිරාජ්‍යයේ රාජ්‍ය ආගම බවට පත් කළේ ය. (.........)

**32. දේශ ගවේෂණ**
(1) ස්පාඤ්ඤයෝ හා පෘතුගීසිහු දේශ ගවේෂණ ව්‍යාපාරයේ පුරෝගාමීන් වූහ.
(2) දේශ ගවේෂණවල ප්‍රධාන අරමුණ වූයේ පෙරදිග කරා නව මාර්ගයක් සොයා ගැනීමයි.
(3) ෆර්ඩිනන්ඩ් සහ ඉසබෙලා, වස්කෝ ද ගාමාගේ මුහුදු යාත්‍රික ගමන්වලට අනුග්‍රහය දක්වූහ.
(4) වස්කෝ ද ගාමා 1498 දී කැලිකට්හි ගොඩ බැස්සේ ය.
(5) ඇල්බකර්ක් පෘතුගීසි පෙරදිග අධිරාජ්‍යයේ නිර්මාතෘවරයා ලෙස සලකනු ලැබේ. (.........)

**33. ඉතාලිය එක්සත් කිරීම**

(1) ඉතාලියේ පැවැති බ්‍රිතාන්‍ය ආධිපත්‍යය, ඉතාලිය එක්සත් කිරීමට එරෙහි ව තිබූ ප්‍රධාන බාධකයක් විය.
(2) පීඩ්මන්ට්-සාර්ඩිනියා රාජ්‍යයේ නායකත්වය යටතේ ඉතාලි එක්සත්භාවය සාක්ෂාත් කර ගන්නා ලදී.
(3) කැවූර් ඉතාලිය එක්සත් කිරීමේ නිර්මාපකයා විය.
(4) නේපල්ස් ප්‍රදේශය හා සිසිලිය, ගැරිබෝල්ඩිගේ ආධාරයෙන් පීඩ්මන්ට්-සාර්ඩිනියා රාජ්‍යයට ඈඳනු ලැබී ය.
(5) 1870 දී රෝමය ඉතාලියේ අගනුවර ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. (.........)

**34. දෙවන ලෝක යුද්ධය**

(1) දෙවන ලෝක යුද්ධය මානව ඉතිහාසයේ වඩාත් ම විනාශකාරී යුද්ධය ලෙස සලකනු ලැබේ.
(2) ජපානය පරාජයට පත්වීමෙන් දෙවන ලෝක යුද්ධය අවසන් විය.
(3) දෙවන ලෝක යුද්ධය අවසානයේ දී, ලෝක සාමය පවත්වාගෙන යාම සඳහා ජාතීන්ගේ සංගමය පිහිටුවන ලදී.
(4) දෙවන ලෝක යුද්ධය, යුරෝපයේ විදේශ අධිරාජ්‍ය කැඩී බිඳී යාම වේගවත් කළේ ය.
(5) දෙවන ලෝක යුද්ධයෙන් පසු, ඇමෙරිකා එක්සත් ජනපදයේ හා සෝවියට් දේශයේ නායකත්වය යටතේ බල කඳවුරු දෙකක් ඇති විය. (.........)

**35. දෙවන ලෝක යුද්ධයෙන් පසු සෝවියට් දේශය**

(1) ජෝශප් ස්ටාලින් නව ආර්ථික ප්‍රතිපත්තිය (NEP) හඳුන්වා දුන්නේ ය.
(2) නිකිතා කෘෂ්චෙෆ්, ස්ටාලින් හා ඔහුගේ ක්‍රමෝපායයන් හෙලා දුටුවේ ය.
(3) මිහායිල් ගොර්බචොෆ් ග්ලස්නොස්ට් හෙවත් විවෘතභාවය නම් ප්‍රතිපත්තිය ආරම්භ කළේ ය.
(4) ගොර්බචොෆ් පෙරෙස්ත්‍රොයිකා හෙවත් ආර්ථික ප්‍රතිව්‍යුහකරණය නම් ප්‍රතිපත්තිය ද ප්‍රකාශයට පත් කළේ ය.
(5) ගොර්බචොෆ් අනුගමනය කළ ප්‍රතිපත්ති නිරවි යුද්ධය ලිහිල්වීමට තුඩු දුන්නේ ය. (.........)

● අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දැක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලයදැ'යි තෝරා ඊට අදාළ **අංකය වරහන් තුළ ලියන්න.**

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1. | නිවැරදි ය. | වැරදි ය. |
| 2. | නිවැරදි ය. | නිවැරදි ය. |
| 3. | වැරදි ය. | වැරදි ය. |
| 4. | වැරදි ය. | නිවැරදි ය. |
| 5. | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| 36. | ග්‍රීක පෙර රාජ්‍යවල පැවැති ප්‍රජාතන්ත්‍රවාදී හැඩගැස්ම ඇතන්ස් රාජ්‍යයෙන් ඉතාමත්ම මැනවින් පැහැදිලි වේ. | වැඩිහිටි පිරිමි පුරවැසියන් සියලු ම දෙනාට විවෘත වූ මන්ත්‍රණ සභාවේදී ඇතීනියානුවෝ රාජ්‍ය කටයුතු හා සම්බන්ධ වැදගත් ප්‍රශ්න සම්බන්ධයෙන් විවාද කොට ඡන්දය දුන්හ. | (.........) |
| 37. | පුරාණ ග්‍රීකයන්ගේ ශ්‍රේෂ්ඨතම කාර්ය සිද්ධිය නම් ග්‍රීක නීතියයි. | වර්ජිල් සහ හොරස්, පුරාණ රෝමයේ සිටි ප්‍රසිද්ධ කවියන් දෙදෙනකු වූහ. | (.........) |
| 38. | 1774 ප්‍රථම මහාද්වීපික සම්මේලනයේදී පවත්වන ලද සුප්‍රසිද්ධ තේ සාදය, "බොස්ටන් තේ සාදය" නමින් හැඳින්වේ. | ඇමෙරිකානු විප්ලවයේදී, ඇමෙරිකානුවෝ "නිදහස, සමානාත්මතාව හා සහෝදරත්වය" නම් සටන් පාඨය යටතේ ඉංග්‍රීසින්ට විරුද්ධව සටන් කළහ. | (.........) |
| 39. | 1945 මැයි මාසයේදී ජර්මනිය, කොන්දේසි විරහිතව මිත්‍ර ජාතීන්ගේ හමුදාවලට යටත් විය. | ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව සෝවියට් ආධිපත්‍යය පැවැති කලාපයේ පිහිටුවනු ලැබීය. | (.........) |
| 40. | සෝවියට් දේශය හා එහි පරිවාර රාජ්‍යයන් විසින් 1955 දී අත්සන් කරන ලද අන්‍යොන්‍ය ආරක්ෂක ගිවිසුම වෝර්සෝ සම්මුතිය නමින් හඳුන්වනු ලැබේ. | සෝවියට් දේශයේ බිඳවැටීමත් සමඟ නිරවි යුද්ධය අවසන් විය. | (.........) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉතිහාසය II (II කොටස)
வரலாறு II (பகுதி II)
History II (Part II)

25-B S II

**යුරෝපා ඉතිහාසය - ඈත අතීතයේ සිට ක්‍රි.ව. 1989 දක්වා**

උපදෙස්:
* **පළමුවන** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම** ස්ථාන ලකුණු කොට නම් කරන්න. ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ ව කෙටි ඓතිහාසික සටහන් ලියන්න.
(i) ක්‍රීට් දූපත (ii) ටයිබර් ගඟ
(iii) කොන්ස්තන්තිනෝපලය (iv) ලන්ඩන්
(v) ස්විට්සර්ලන්තය (vi) ඉංග්‍රීසි ඕඩය
(vii) බෝල්ටික් මුහුද (viii) ඩැන්සිග්
*(නිවැරදිව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි)*

2. කුඩා ලතින් රාජ්‍යයක සිට විශාල අධිරාජ්‍යයක් දක්වා රෝම බල ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා ගෙනහැර දක්වන්න. *(ලකුණු 14 යි)*

3. (i) මධ්‍යකාලීන යුරෝපයේ වැඩවසම් ක්‍රමය බිහිවීමට තුඩු දුන් ප්‍රධාන සාධක කෙටියෙන් පරීක්ෂා කරන්න. *(ලකුණු 05 යි)*
(ii) දේශපාලන හා සමාජ-ආර්ථික ක්‍රමයක් ලෙස වැඩවසම් ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න. *(ලකුණු 09 යි)*

4. "කාර්මික විප්ලවය නිසැකව ම යුරෝපා සමාජය තුළ විශාල පරිවර්තනයක් ඇති කළේ ය."
(i) කාර්මික විප්ලවය ආරම්භ වූ රට නම් කරන්න. *(ලකුණු 01 යි)*
(ii) කාර්මික ක්ෂේත්‍රයේ මුල්කාලීන නිපැයුම් **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*
(iii) කාර්මික විප්ලවය ඇතිවීමට තුඩු දුන් සාධක සැකෙවින් සඳහන් කරන්න. *(ලකුණු 04 යි)*
(iv) කාර්මික විප්ලවයෙන් උද්ගත වූ ආර්ථික හා සමාජ ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය සාකච්ඡා කරන්න. *(ලකුණු 07 යි)*

5. ප්‍රංශ විප්ලවය ඇතිවීමට තුඩු දුන් දේශපාලන, ආර්ථික හා සමාජ පසුබිම විග්‍රහ කරන්න. *(ලකුණු 14 යි)*

6. "බිස්මාර්ක් යටතේ ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ සෑම අවස්ථාවක් ම යුද්ධයකින් අවසන් විය."
(i) ජර්මනිය එක්සත් කිරීමෙහි ලා මූලිකත්වය ගත් රාජ්‍යය නම් කරන්න. *(ලකුණු 01 යි)*
(ii) එම රාජ්‍යයේ නායකත්වය යටතේ පිහිටුවා තිබූ තීරු බදු සංගමය නම් කරන්න. *(ලකුණු 01 යි)*
(iii) 1815 සහ 1848 අතර කාලයේ ජර්මනිය එක්සත් කිරීමට එරෙහිව තිබූ බාධක සැකෙවින් දක්වන්න. *(ලකුණු 04 යි)*
(iv) බිස්මාර්ක් යටතේ ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේ ප්‍රධාන අවස්ථා පරීක්ෂා කරන්න. *(ලකුණු 08 යි)*

7. "පළමුවන ලෝක යුද්ධයෙන් පසු යුරෝපයේ ඒකාධිපතිවාදී පාලන තන්ත්‍ර නැගී ඒම නිසා දෙවන ලෝක යුද්ධය ඇති වීම නොවැළැක්විය හැකි විය."
(i) පළමුවන ලෝක යුද්ධය අවසන් කරමින් ජර්මනිය විසින් අත්සන් කරන ලද ගිවිසුම කුමක් ද? *(ලකුණු 01 යි)*
(ii) පළමුවන ලෝක යුද්ධයෙන් පසු, ලෝක සාමය අරමුණු කොටගෙන පිහිටුවන ලද ජාත්‍යන්තර සංවිධානය නම් කරන්න. *(ලකුණු 01 යි)*
(iii) පළමුවන ලෝක යුද්ධයෙන් පසු ඉතාලියේ හා ජර්මනියේ නැගී ආ ඒකාධිපතිවාදී පාලන තන්ත්‍ර කවරේ ද? *(ලකුණු 02 යි)*
(iv) එම ඒකාධිපති පාලන තන්ත්‍රවල නායකයෝ කවරහු ද? *(ලකුණු 02 යි)*
(v) දෙවන ලෝක යුද්ධයට තුඩු දුන් හේතු ඇසුරෙන් ඉහත සඳහන් ප්‍රකාශය සාකච්ඡා කරන්න. *(ලකුණු 08 යි)*

[ හත්වෙනි පිටුව බලන්න.

8. පහත දැක්වෙන පුද්ගලයන් අතුරෙන් ඕනෑම **දෙදෙනකුගේ** ඓතිහාසික වැදගත්කම පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ලියනාඩෝ ඩා වින්චි

(ii) මාටින් ලූතර්

(iii) නැපෝලියන් බොනපාට්

(iv) කැමිලෝ කැවූර්

(v) වී.අයි. ලෙනින්

*(එකකට ලකුණු 07 බැගින්)*

9. දෙවන ලෝක යුද්ධය අවසන් වීමෙන් පසු පළමු දශකය තුළ දී ලෝකයේ බලවත් රටවල් කඳවුරු දෙකකට බෙදී ගිය අයුරු පරීක්ෂා කරන්න. *(ලකුණු 14 යි)*

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

**නව නිර්දේශය**
**புதிய பாடத்திட்டம்**
**New Syllabus**

| | | |
|---|---|---|
| ඉතිහාසය II<br>வரலாறு II<br>History II | 25-B | S |

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. **01**

විභාග අංකය / சுட்டெண் / Index No. ....................................



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉතිහාසය II (I කොටස)
வரலாறு II (பகுதி I)
History II (Part I)

25-C S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

**නූතන ලෝක ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා**

විභාග අංකය: ..................................

**උපදෙස් :**

- මෙම කොටස ප්‍රශ්න 40 කින් සමන්විත වේ. **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට ප්‍රතිචාර **පහ** බැගින් දී ඇති නමුදු නිවැරදි පිළිතුර වන්නේ **එකක්** පමණි. එම නිවැරදි පිළිතුර තෝරා දී ඇති **උපදෙස් පරිදි ලකුණු කරන්න.**
- **මෙම කොටසට ලකුණු 40 ක් දෙනු ලැබේ.**
- කොටස් දෙකට ම මුළු කාලය පැය තුනකි. පිළිතුරු ලියා අවසන් වූ පසු, I කොටස, II කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා භාර දෙන්න.**

## I කොටස

- අංක 1 සිට 10 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා නම් **පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් **එකක්** පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමඟ **නො ගැළපේ.** එම **නො ගැළපෙන** නම කුමක්දැ'යි හඳුනාගෙන එහි **අංකය වරහන් තුළ ලියන්න.**

1. (1) ඇමසන් (2) ඩැනියුබ් (3) එල්බ් (4) රයින් (5) සේන් (.........)

2. (1) කළු මුහුද (2) කැස්පියන් මුහුද (3) මධ්‍යධරණී මුහුද (4) රතු මුහුද (5) කහ මුහුද (.........)

3. (1) අක්බාර් (2) ජහංගීර් (3) මුම්ටාස් මහල් (4) ෂා ජහන් (5) අවුරංසෙබ් (.........)

4. (1) මදුරාසිය (2) බොම්බාය (3) කල්කටාව (4) ඉස්ලාමාබාද් (5) පොන්ඩිචෙරි (.........)

5. (1) නිව්යෝර්ක් (2) වොෂිංටන් (3) ලිවර්පූල් (4) චිකාගෝ (5) සැන් ෆ්‍රැන්සිස්කෝ (.........)

6. (1) ඇල්ජීරියාව (2) ගුවතමාලාව (3) ලිබියාව (4) නයිජීරියාව (5) සෝමාලියාව (.........)

7. (1) වොරන් හේස්ටිංස් (2) කෝන්වොලිස් (3) වෙලෙස්ලි (4) විලියම් බෙන්ටින්ක් (5) විල්මට් හෝර්ටන් (.........)

8. (1) කාල් මාක්ස් (2) වී.අයි. ලෙනින් (3) ජෝශප් ස්ටාලින් (4) නිකිතා කෲෂ්චෙෆ් (5) මිහායල් ගොර්බචොෆ් (.........)

9. (1) ලොයිඩ් ජෝර්ජ් (2) වුඩ්රෝ විල්සන් (3) ජෝර්ජ් ක්ලෙමෙන්සෝ (4) විටෝරියෝ ඕර්ලැන්ඩෝ (5) ඇඩොල්ෆ් හිට්ලර් (.........)

10. (1) අරාබි ලීගය
(2) යුරෝපා ආර්ථික හවුල (EEC)
(3) ඛනිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානය (OPEC)
(4) අග්නිදිග ආසියාතික ජාතීන්ගේ සංගමය (ASEAN)
(5) කලාපීය සහයෝගීතාව සඳහා වූ දකුණු ආසියාතික සංගමය (SAARC) (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

- අංක **11** සිට **15** තෙක් ප්‍රශ්නවල **පද යුගල පහ** බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට **නො ගැළපේ. එම නො ගැළපෙන** යුගලය කුමක්ද'යි හඳුනාගෙන ඊට අදාළ **අංකය,** ඉදිරියේ ඇති **වරහන් තුළ ලියන්න.**

**11.** (1) බ්‍රසීලය - පෘතුගීසි
(2) මෙක්සිකෝ - ස්පාඤ්ඤ
(3) හයිටි - ප්‍රංශ
(4) කියුබාව - ලන්දේසි
(5) ජැමෙයිකා - බ්‍රිතාන්‍ය (.........)

**12.** (1) ලෙවියතාන් (Leviathan) - තොමස් හොබ්ස්
(2) සමාජ සම්මුතිය (Social Contract) - රූසෝ
(3) නීතියේ සාරය (Spirit of the Laws) - වෝල්ටෙයාර්
(4) ජාතීන්ගේ ධනය (Wealth of Nations) - ඇඩම් ස්මිත්
(5) මයින් කාම්ෆ් (මගේ සටන) - ඇඩොල්ෆ් හිට්ලර් (.........)

**13.** (1) පෝලන්තය - ස්ටොක්හෝම්
(2) ඔස්ට්‍රියාව - වියානා
(3) හංගේරියාව - බුඩාපෙස්ට්
(4) බල්ගේරියාව - සොෆියා
(5) යුගොස්ලාවියාව - බෙල්ග්‍රේඩ් (.........)

**14.** (1) සයිමන් බොලිවාර් - වෙනිසුවෙලා
(2) මාඕ සේතුං - චීනය
(3) රාමොන් මැග්සේසේ - පිලිපීනය
(4) ෆිඩෙල් කස්ත්‍රෝ - මෙක්සිකෝව
(5) ක්වාමේ නික්‍රෘමා - ඝානා (.........)

**15.** (1) ඉන්දියාව - මහත්මා ගාන්ධි
(2) වියට්නාමය - හෝ චි මිං
(3) බුරුමය - අවුන් සාන්
(4) කෙන්යාව - ජෝමෝ කෙන්යාටා
(5) රොඩේෂියාව - මිරන්ඩා (.........)

- අංක **16** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි නාම / ප්‍රකාශන / දින වකවානු සමූහයක් X සහ Y තීරුවල දී ඇත. Y තීරුවේ දී ඇති නාම / ප්‍රකාශන / දින වකවානු X තීරුවේ දී ඇති ඒවා සමඟ කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නො වේ. Y තීරුව, X තීරුව සමඟ ගැළපෙන අනුපිළිවෙළට සකස් කළ විට පහත දී ඇති සංයෝග **පහෙන්** එකක් නිවැරදි ය. නිවැරදි සංයෝගයට අයත් **අංකය** තෝරා **වරහන් තුළ ලියන්න.**

**16.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | 'කුළුබඩු හා ක්‍රිස්තියානින් සොයා අපි පෙරදිගට පැමිණියෙමු.' | A | දහතරවන ලුවී |
| (ii) | 'කුමාරයා, සිංහයා සහ හිවලා අනුකරණය කළ යුතු ය.' | B | නැපෝලියන් බොනපාට් |
| (iii) | 'රාජ්‍යය යනු මම වෙමි.' | C | රූසෝ |
| (iv) | 'නිදහස්ව උපත ලැබුව ද මිනිසා සැමතැන ම යදම්වලින් බැඳ දමා ඇත.' | D | වස්කෝ ද ගාමා |
| (v) | 'විප්ලවය යනු මම වෙමි.' | E | මකියාවෙලී |

(1) AECBD (2) DEACB (3) ADECB (4) DCAEB (5) BAECD (.........)

**17.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | මෝගල් | A | ප්‍රංශය |
| (ii) | බූර්බන් | B | එංගලන්තය |
| (iii) | ටොකුගාවා | C | ඉන්දියාව |
| (iv) | මැන්චු | D | ජපානය |
| (v) | හැනෝවර් | E | චීනය |

(1) CBAED (2) DEBCA (3) ECBDA (4) CADEB (5) DBCAE (.........)

**18.**

| | X | | Y |
|---|---|---|---|
| (i) | පළමුවන පනිපත් සටන | A | වෙලිංටන් |
| (ii) | වයිට්හිල් සටන | B | බාබර් |
| (iii) | ප්ලසේ සටන | C | විලි |
| (iv) | ට්‍රැෆල්ගාර් සටන | D | රොබට් ක්ලයිව් |
| (v) | වෝටර්ලූ සටන | E | නෙල්සන් |

(1) ACEBD (2) BCDEA (3) AECBD (4) BDEAC (5) CEDBA (.........)

0177



**19.**

| X | Y |
|---|---|
| (i) ආර්ජන්ටිනාව | A ට්‍රිපොලි |
| (ii) ලිබියාව | B ඩකා |
| (iii) ඉන්දුනීසියාව | C බැංකොක් |
| (iv) තායිලන්තය | D ජකර්තා |
| (v) බංගලාදේශය | E බුවනෝස් අයර්ස් |

(1) BDCEA (2) CBDAE (3) ECDAB (4) CABDE (5) EADCB (.........)

**20.**

| X | Y |
|---|---|
| (i) බොක්සර් සටන | A පැරිස් ගිවිසුම |
| (ii) අබිං යුද්ධය | B අලහබාද් ගිවිසුම |
| (iii) ක්‍රිමියන් යුද්ධය | C වර්සායි ගිවිසුම |
| (iv) රුසියානු-ජපන් යුද්ධය | D නැන්කිං ගිවිසුම |
| (v) පළමුවන ලෝක යුද්ධය | E පෝට්ස්මත් ගිවිසුම |

(1) CABED (2) BDAEC (3) BAEDC (4) CBEAD (5) DEABC (.........)

**21.**

| X | Y |
|---|---|
| (i) තරුණ ඉතාලිය | A ස්වාමි දයානන්ද් |
| (ii) ආර්ය සමාජ් | B හෝ චි මිං |
| (iii) පරම විඥනාර්ථ සමාගම | C විනෝබා භාවේ |
| (iv) භූදාන් ව්‍යාපාරය | D මැසිනි |
| (v) වියට්මිං | E බ්ලවට්ස්කි |

(1) BAEDC (2) ACBDE (3) DAECB (4) BCDEA (5) DECAB (.........)

**22.**

| X | Y |
|---|---|
| (i) චාල්ස් ඩිකන්ස් | A අම්මා |
| (ii) හැරියට් බීචර් ස්ටෝව් | B ගීතාංජලී |
| (iii) මැක්සිම් ගෝර්කි | C ඔලිවර් ට්විස්ට් |
| (iv) රබීන්ද්‍රනාත් තාගෝර් | D ටොම් මාමාගේ කුටිය (Uncle Tom's Cabin) |
| (v) පර්ල් එස්. බක් | E සරු පස (Good Earth) |

(1) CDABE (2) DABCE (3) CADEB (4) DBCAE (5) ECDAB (.........)

**23.**

| X | Y |
|---|---|
| (i) මාර්ෂල් ටිටෝ | A පාකිස්තානය |
| (ii) මොහමඩ් අලි ජින්නා | B ඊජිප්තුව |
| (iii) අබ්දුල් නසර් | C සිංගප්පූරුව |
| (iv) ලී කුවාන් යූ | D චිලී |
| (v) සැල්වදෝර් ඇලන්ඩේ | E යුගොස්ලාවියාව |

(1) EBCAD (2) CABED (3) DEBAC (4) CDEAB (5) EABCD (.........)

**24.**

| X | Y |
|---|---|
| (i) ජාත්‍යන්තර අධිකරණය (ICJ) | A නිව්යෝර්ක් |
| (ii) ලෝක බැංකුව | B හේග් |
| (iii) එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) | C වොෂිංටන් |
| (iv) එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO) | D ජිනීවා |
| (v) ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) | E පැරිස් |

(1) CBAED (2) DACBE (3) CDABE (4) BCAED (5) BAECD (.........)

**25.**

| X | Y |
|---|---|
| (i) 1947 | A ඉන්දුනීසියාව නිදහස ලබා ගැනීම |
| (ii) 1949 | B බෙල්ජියන් කොංගෝව නිදහස ලබා ගැනීම |
| (iii) 1960 | C බංගලාදේශය බිහි වීම |
| (iv) 1963 | D ඉන්දියාව නිදහස ලබා ගැනීම |
| (v) 1971 | E කෙන්යාව නිදහස ලබා ගැනීම |

(1) DABEC (2) ECDBA (3) DBACE (4) EDBCA (5) BDCAE (.........)

[ හතරවෙනි පිටුව බලන්න.

- අංක **26** සිට **30** තෙක් සෑම ප්‍රශ්නයකට ම නිවැරදි පිළිතුර තෝරා, එහි **අංකය** ඉදිරියේ ඇති **වරහන් තුළ** ලියන්න.

**26. 1770 දී ඕස්ට්‍රේලියාව 'සොයාගත්' ඉංග්‍රීසි ජාතිකයා කවු ද?**
(1) ජෝන් කැබෝ
(2) හෙන්රි හඩ්සන්
(3) වෝල්ටර් රලේ
(4) ජේම්ස් කුක්
(5) ජෝර්ජ් මැකාර්ට්නි (.........)

**27. බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය කිරීටයේ මාණික්‍යය ලෙස හඳුන්වන ලද යටත්විජිතය කුමක් ද?**
(1) කැනඩාව
(2) ඉන්දියාව
(3) ශ්‍රී ලංකාව
(4) ඕස්ට්‍රේලියාව
(5) නවසීලන්තය (.........)

**28. 1853 දී ජපානයට යාත්‍රා කළ අමෙරිකානු නාවික නිලධාරියා කවු ද?**
(1) හෙන්රි හාඩින්ග්
(2) මිලාර්ඩ් ෆිල්මෝර්
(3) මැතිව් සී. පෙරි
(4) විලියම් ටාෆ්ට්
(5) ෆ්‍රැන්සිස් බර්ටන් හැරිසන් (.........)

**29. කුවොමින්තාං පක්ෂය පිහිටුවන ලද්දේ කවුරුන් විසින් ද?**
(1) කාං යූ වෙයි
(2) යුවාන් ෂිහ් කායි
(3) සුන් යත් සෙන්
(4) චෙන් තු-ෂියු
(5) චෞ එන් ලායි (.........)

**30. ජාතීන්ගේ සංගමයේ මූලස්ථානය පිහිටා තිබුණේ කුමන නගරයේ ද?**
(1) නිව්යෝර්ක්
(2) ජිනීවා
(3) පැරිස්
(4) රෝමය
(5) බ්‍රසල්ස් (.........)

- අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති **(A), (B), (C)** සහ **(D)** යන ප්‍රතිචාර හතර අතුරෙන් **එකක් හෝ කිහිපයක් හෝ නිවැරදි ය.** නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර හෝ තෝරා,
**(A)** සහ **(B)** පමණක් නිවැරදි නම් .................................... **1 ද,**
**(B)** සහ **(C)** පමණක් නිවැරදි නම් .................................... **2 ද,**
**(C)** සහ **(D)** පමණක් නිවැරදි නම් .................................... **3 ද,**
**(A)** සහ **(C)** පමණක් නිවැරදි නම් .................................... **4 ද,**
ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් හෝ නිවැරදි නම් .......... **5 ද, වරහන් තුළ ලියන්න.**

| **උපදෙස් සම්පිණ්ඩනය** | | | | |
|---|---|---|---|---|
| **1** | **2** | **3** | **4** | **5** |
| **(A)** සහ **(B)** පමණක් නිවැරදි ය. | **(B)** සහ **(C)** පමණක් නිවැරදි ය. | **(C)** සහ **(D)** පමණක් නිවැරදි ය. | **(A)** සහ **(C)** පමණක් නිවැරදි ය. | ප්‍රතිචාර **එකක්** හෝ **දෙකකට** වැඩි සංඛ්‍යාවක් නිවැරදි ය. |

**31. පහළොස්වන හා දහසයවන සියවස්වල ඇති වූ දේශ ගවේෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) පෘතුගීසි දේශ ගවේෂණ කටයුතු මුලින්ම නාවික හෙන්රිගේ අනුග්‍රහය යටතේ කරගෙන යනු ලැබී ය.
(B) ක්‍රිස්ටෝෆර් කොලම්බස් පෘතුගීසි පාලකයන්ගේ ආධාරය ඇති ව ඉන්දියාවට පැමිණියේ ය.
(C) දේශ ගවේෂණවලින් උද්ගත වූ වඩාත් වැදගත් ප්‍රතිඵලයක් නම් යුරෝපා රටවල් විසින් මුහුදින් එතෙර අධිරාජ්‍ය ගොඩගනු ලැබීමයි.
(D) අල්ෆොන්සෝ ද ඇල්බකර්ක් ස්පාඤ්ඤ විදේශ අධිරාජ්‍යයේ නිර්මාපකයා ය. (.........)

**32. එංගලන්තයේ පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ වර්ධනය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?**
(A) ස්ටුවර්ට් රජවරු පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළහ.
(B) 1688 ඉංග්‍රීසි විප්ලවය, එංගලන්ත පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයේ වර්ධනයේ ඉතාමත් වැදගත් අවස්ථාවක් සලකුණු කරයි.
(C) 1911 දී සාමි මන්ත්‍රී මණ්ඩලයේ බලතල අඩු කරනු ලැබී ය.
(D) දෙවන ලෝක යුද්ධයෙන් පසු එංගලන්තයට සර්වජන ඡන්දබලය හඳුන්වා දෙන ලදී. (.........)

[ පස්වෙනි පිටුව බලන්න.

**33.** 1789 ප්‍රංශ විප්ලවය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) බැස්ටිල් බන්ධනාගාරයට පහර දීම ප්‍රංශ විප්ලවයේ ආරම්භය සලකුණු කරයි.

(B) 1789 අගෝස්තු මස ජාතික සභාව විසින් මිනිස් අයිතිවාසිකම් ප්‍රකාශනය නිකුත් කරනු ලැබී ය.

(C) විප්ලව සමයේ දී දහසයවන ලුවී රජතුමා ගිලටීනයට යවා මරණයට පත් කරන ලදී.

(D) රොබෙස්පියර් විප්ලවයේ දරුවා ලෙස සලකනු ලැබේ. (.........)

**34.** ඉන්දුනීසියාවේ ස්වාධීනතා අරගලය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) විසිවන සියවසේ මැද දක්වා ඉන්දුනීසියාව ලන්දේසි පාලනය යටතේ පැවතුණි.

(B) ආච්මඩ් සුකර්ණෝ විසින් ඉන්දුනීසියානු නිදහස් ව්‍යාපාරය මෙහෙයවන ලදී.

(C) හෝ චි මිං, ඉන්දුනීසියානු ජාතික ව්‍යාපාරයේ තවත් වැදගත් නායකයකු විය.

(D) නිදහසෙන් පසු ඉන්දුනීසියාව, මලයාව සමඟ එක්සත් කරනු ලැබී ය. (.........)

**35.** දෙවන ලෝක යුද්ධය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශය/ ප්‍රකාශ නිවැරදි වේ ද?

(A) ඔස්ට්‍රියාවේ ෆ්‍රාන්ස් ෆර්ඩිනන්ඩ් ආදිපාදවරයා සහ ඔහුගේ බිරිඳ ඝාතනය කරනු ලැබීම දෙවන ලෝක යුද්ධය ඇති වීමට තුඩු දුන් ආසන්නත ම හේතුව විය.

(B) ජර්මනිය ජයග්‍රහණය ලබමින් යුද්ධය අවසන් විය.

(C) යුද්ධයෙන් පසු, ලෝක සාමය පවත්වාගෙන යාම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවන ලදී.

(D) දෙවන ලෝක යුද්ධය, යුරෝපයේ විදේශ අධිරාජ්‍ය බිඳ වැටීම කඩිනම් කළේ ය. (.........)

- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය සම්බන්ධයෙන් දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ම ගැළපෙනුයේ පහත වගුවෙහි දක්වෙන **1, 2, 3, 4** සහ **5** යන කවර ප්‍රකාශ යුගලයද'යි තෝරා ඊට අදාළ **අංකය වරහන් තුළ ලියන්න.**

| | **පළමුවැනි ප්‍රකාශය** | **දෙවැනි ප්‍රකාශය** |
|---|---|---|
| **1.** | නිවැරදි ය. | වැරදි ය. |
| **2.** | නිවැරදි ය. | නිවැරදි ය. |
| **3.** | වැරදි ය. | වැරදි ය. |
| **4.** | වැරදි ය. | නිවැරදි ය. |
| **5.** | නිවැරදි ය. | නිවැරදි වන අතර **පළමුවැන්න** මැනවින් පහදා දෙයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **36.** | ඉතාලි නගරවල ආරම්භ වූ ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය බටහිර යුරෝපය පුරා පැතිර ගියේ ය. | මධ්‍යතන අවධියේ යුරෝපයේ පැවැති ආගමික ඒකීයත්වය, ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය විසින් අවසන් කරනු ලැබී ය. | (.........) |
| **37.** | 1898 දී සියම අමෙරිකන් යටත් විජිතයක් බවට පත් විය. | 1911 දී චීනයේ ඇති වූ විප්ලවය චියැං කායිෂෙක් විසින් මෙහෙයවන ලදී. | (.........) |
| **38.** | 1911 දී චීනයේ ඇති වූ විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස මැංචූ ආණ්ඩුව බිඳ වැටුණි. | 1917 බැල්ෆර් ප්‍රකාශය මගින් පලස්තීනය තුළ යුදෙව් රාජ්‍යයක් සඳහා ආධාර දෙන බවට බ්‍රිතාන්‍ය ආණ්ඩුව පොරොන්දු විය. | (.........) |
| **39.** | දෙවන ලෝක යුද්ධය ලෝක බල සැකැස්මේ මාරු වීමක් සිදු කළේ ය. | දෙවන ලෝක යුද්ධයෙන් පසු, එක්සත් ජනපදය හා සෝවියට් දේශය වඩාත් ම බලවත් රටවල් දෙක ලෙස මතු වී ආ අතර, සාම්ප්‍රදායික මහා බලවතුන් වූ බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ජර්මනිය, එම සුපිරි බලවතුන්ට ද්විතීයික තත්ත්වයට පත් විය. | (.........) |
| **40.** | දකුණු අප්‍රිකානු ආණ්ඩුව කළු මිනිසුන් හා සුදු මිනිසුන් සමාජයේ සෑම මට්ටමකදී ම වෙන් කිරීම සඳහා විසිවන සියවසේ මැද හඳුන්වා දුන් ප්‍රතිපත්තිය 'ඇපාර්තීඩ්' යනුවෙන් හඳුන්වනු ලැබේ. | ජවහර්ලාල් නේරු තුමන්ගේ අනුප්‍රාප්තිකයා ලෙස එතුමන්ගේ දියණිය වූ ඉන්දිරා ගාන්ධි 1964 දී ඉන්දියාවේ දෙවැනි අගමැති ලෙස පත් වූවා ය. | (.........) |

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ඉතිහාසය II (II කොටස)
வரலாறு II (பகுதி II)
History II (Part II)

25-C S II

**නූතන ලෝක ඉතිහාසය - ක්‍රි.ව. 1500 සිට 1989 දක්වා**

උපදෙස් :

✳ **පළමු වන** ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.
(**පළමු වන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **ලෝකයේ දළ සිතියමක්** සපයා ඇත.)

## II කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න**. ඒවායින් කැමති **දෙකක්** පිළිබඳ ව ඓතිහාසික සටහන් ලියන්න.
   (i) නයිල් ගඟ
   (ii) කියුබාව
   (iii) හඩ්සන් බොක්ක
   (iv) බෝර්නියෝ
   (v) කල්කටා
   (vi) නෝර්වේ
   (vii) ගෝල්ඩ් කෝස්ට් (රන් වෙරළ)
   (viii) පැනමා ඇළ

   *(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු 01 බැගිනි. කෙටි ඓතිහාසික සටහනකට ලකුණු 05 බැගිනි)*

2. "පුනරුදය නූතනත්වයේ ආරම්භය සලකුණු කරයි."
   (i) පුනරුදය ආරම්භ වූ රට නම් කරන්න. *(ලකුණු 01 යි)*
   (ii) පුනරුදය ඇතිවීමට තුඩු දුන් සාධක **දෙකක්** සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*
   (iii) 'පුනරුදය' නම් පදය යුරෝපා සංස්කෘතිය ඇසුරෙන් සැකෙවින් අර්ථ දක්වන්න. *(ලකුණු 03 යි)*
   (iv) පුනරුදයේ ප්‍රධාන ලක්ෂණ විග්‍රහ කරමින් ඉහත සඳහන් ප්‍රකාශය පරීක්ෂා කරන්න. *(ලකුණු 08 යි)*

3. "කාර්මික විප්ලවය, දහනව වන ශතවර්ෂයේ යුරෝපයේ ආර්ථිකය හා සමාජය පරිවර්තනය වීමට බලපෑ වැදගත් සාධකයකි."
   (i) කාර්මික විප්ලවය ආරම්භ වූ රට නම් කරන්න. *(ලකුණු 01 යි)*
   (ii) කාර්මික විප්ලවයේ මුල් අවස්ථාවේ දී කපු කර්මාන්තය ආශ්‍රිතව ඇති වූ නව නිපැයුම් **දෙකක්** නම් කරන්න. *(ලකුණු 02 යි)*
   (iii) කාර්මික විප්ලවය ඇති වීමට තුඩු දුන් සාධක **තුනක්** සැකෙවින් දක්වන්න. *(ලකුණු 03 යි)*
   (iv) කාර්මික විප්ලවයේ කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය විචාරාත්මක ව විමසන්න. *(ලකුණු 08 යි)*

4. (i) 1857 බ්‍රිතාන්‍ය විරෝධී ඉන්දියානු නැඟී සිටීම ඇති වීමට තුඩු දුන් ප්‍රධාන සාධක විග්‍රහ කරන්න. *(ලකුණු 08 යි)*
   (ii) එම නැඟී සිටීමෙන් උද්ගත වූ ප්‍රතිඵල කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් බ්‍රිතාන්‍ය ඉන්දීය ඉතිහාසයෙහි ලා එහි ඇති වැදගත්කම පරීක්ෂා කරන්න. *(ලකුණු 06 යි)*

5. දහනව වන ශතවර්ෂය තුළ ජපානයේ ආර්ථික, සමාජ හා දේශපාලන ව්‍යුහය බිඳ වැටීමට තුඩු දුන් සාධක සැකෙවින් සමාලෝචනය කරන්න. *(ලකුණු 14 යි)*

6. "පළමුවන ලෝක යුද්ධය අපරදිග ඉතිහාසයේ සංධිස්ථානයකි."
   (i) පළමු වන ලෝක යුද්ධය ඇති වීමට තුඩු දුන් ආසන්න හේතුව කුමක් ද? (ලකුණු 01 යි)
   (ii) පළමු වන ලෝක යුද්ධයේ දී එකිනෙකට විරුද්ධව සටන් කළ බල කඳවුරු දෙකට අයත් වූ පසමිතුරු රටවල් **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   (iii) පළමු වන ලෝක යුද්ධය අවසානයේ දී අත්සන් කරනලද වර්සායි ගිවිසුමේ ප්‍රධාන වගන්ති සැකෙවින් දක්වන්න. (ලකුණු 03 යි)
   (iv) පළමු වන ලෝක යුද්ධයෙන් උද්ගත වූ ප්‍රතිඵල කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත සඳහන් ප්‍රකාශය විවේචනාත්මක ව විමසන්න. (ලකුණු 08 යි)

7. **එක්කෝ** A කොටසට **නැතහොත්** B කොටසට පමණක් පිළිතුරු සපයන්න.

   **A කොටස**
   (i) 1917 රුසියානු විප්ලවය ඇතිවීමට තුඩු දුන් පසුබිම පරීක්ෂා කරන්න. (ලකුණු 08 යි)
   (ii) බොල්ෂෙවික්වරුන්ගේ ජයග්‍රහණයට හේතු වූ කරුණු විස්තර කරන්න. (ලකුණු 06 යි)

   **B කොටස**
   (i) චීනයේ කොමියුනිස්ට් විප්ලවය ඇති වීමට තුඩු දුන් ප්‍රධාන සාධක කවරේ ද? (ලකුණු 08 යි)
   (ii) එම විප්ලවය සාර්ථක වීමෙහි ලා මාඕ සේතුං විසින් ඉටු කරනලද කාර්යභාරය ප්‍රමාණ කරන්න. (ලකුණු 06 යි)

8. 1960 තෙක් අමෙරිකා එක්සත් ජනපදය හා සෝවියට් දේශය මුල්කොටගත් කඳවුරු දෙක අතර පැවැති බල තරගය සැකෙවින් සමාලෝචනය කරන්න. (ලකුණු 14 යි)

9. පහත සඳහන් නායකයන් අතුරෙන් ඕනෑම **දෙදෙනකුගේ** ඓතිහාසික වැදගත්කම පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
   (i) ෆ්‍රැන්ක්ලින් ඩී. රූස්වෙල්ට්
   (ii) මොහොමඩ් අලි ජින්නා
   (iii) සුකර්ණෝ
   (iv) අබ්දුල් නසර්
   (v) ෆිඩෙල් කස්ත්‍රෝ

   (එක් සටහනකට ලකුණු 07 බැගිනි)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

AL/2012/25-C-S-II

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2012 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2012 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2012

නව නිර්දේශය
புதிய பாடத்திட்டம்
New Syllabus

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 01

ඉතිහාසය II / வரலாறு II / History II — 25-C S

විභාග අංකය / சுட்டெண் / Index No. ..............................




WWW.PastPapers.WIKI
Past Papers Wiki - Download More Past Papers and Study Well!